අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ක්රියාවන් අතරින් ජිහාද් කිරීම ශේර්ෂ්ඨතම ක්රියාව ලෙස අපි දකිමු. එහෙයින් අපි ජිහාද් කළ යූතු නොවේ ද?" යැයි විමසුවාය. එතුමාණෝ: "එනමුත් ශේර්ෂ්ඨතම ජිහාද් වනුයේ පිළිගනු ලබන අයුරින් ඉටු කරනු ලබන හජ් වන්දනාවය" යැයි පැවසූහ

දේව විශ්වාසීන්ගේ මෑණියක් වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා
කරන ලදී. "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ක්රියාවන් අතරින් ජිහාද් කිරීම ශේර්ෂ්ඨතම ක්රියාව ලෙස අපි දකිමු. එහෙයින් අපි ජිහාද් කළ යූතු නොවේ ද?" යැයි විමසුවාය. එතුමාණෝ: "එනමුත් ශේර්ෂ්ඨතම ජිහාද් වනුයේ පිළිගනු ලබන අයුරින් ඉටු කරනු ලබන හජ් වන්දනාවය" යැයි පැවසූහ.
[صحيح] [رواه البخاري]

අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කිරීම හා සතුරන් සමග සටන් කිරීම උතුම් ක්රියාවන් අතරින් වේ යැයි නබිතුමාගේ අනුගාමිකයෝ (රළියල්ලාහු අන්හුම්) සිතූහ. එහෙයින් තමන් ජිහාද් කිරීම ගැන ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් විමසා සිටියා ය. ඔවුන්ගේ වගකීම තුළ උතුම්ම ජිහාදය වනුයේ අල් කුර්ආනයට හා සුන්නාවට අනුගත වෙමින් පාපයෙන් හා ප්රදර්ශනය කිරීමෙන් තොරව පිළිගනු ලබන අයුරින් හජ් ඉටු කිරීම යැයි එතුමාණෝ ඔවුනට මඟ පෙන්වූහ.

https://sunnah.global/hadeeth/si/show/2759